# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**6 ශ්‍රේණිය**

## 1. පරිගණකයේ වැදගත්කම

## සටහන - 1

### 1.1 පරිගණකය හඳුනා ගනිමු.

**<u>පරිගණකය යනු,</u>**

- අපගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සකස් කර ඇති වේගවත් ඉලෙක්ට්‍රොනික යන්ත්‍රයකි.
- සංකීර්ණ කාර්ය කාර්යය ඉතාමත් වේගයෙන් හා නිවැරදි ලෙස ඉටුකරගත හැක.
- මිනිසුන්ට මෙන් මහන්සි නොදැනේ.
- බොහෝ වේලාවක් එකම වේගයෙන් වැඩ කළ හැක.

**<u>පරිගණකයේ කාර්යය</u>**

- දත්ත හා උපදෙස් ඇතුලත් කිරීම
- දත්ත සැකසීම
- සකස් කළ දත්ත (තොරතුරු) පිටතට ලබා දීම




- **<u>ආදාන (Input)</u>**
  **පරිගණකය වෙත ලබා ලබාදෙන දත්ත සහ උපදෙස්**

- **<u>ක්‍රියාවලිය (process)</u>**
  **දත්ත සැකසීම**

- **<u>ප්‍රතිදාන (output)</u>**
  **පරිගණකයෙන් පිටතට ලබා දෙන තොරතුරු**

## 1.2 පරිගණකයේ ලාක්ෂණික ගුණාංග

- **වේගය හා කාර්යක්ෂමතාව**

  ඕනෑම කාර්යයක් ඉතාම කෙටි කලකින් නිමකිරීමට හැකිය.

- **නිරවද්‍යතාව**

  නිවැරදි දත්ත හා උපදෙස් ඇතුළත් කළ විට නිවැරදි තොරතුරු ලබා දේ.

- **විශ්වසනීයතාව**

  ලැබෙන තොරතුරු විශ්වාස කළ හැකිය.

- **නියත බව**

  කිසියම් ක්‍රියාවලියකට අදාළව එකම ආදානය ලබා දෙන සෑම විටම එකම ප්‍රතිදානය ලබා දේ.

- **ආචයන ධාරිතාව**

  දත්ත විශාල ප්‍රමාණයක් ගබඩා කර ගැනීමටත් අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී නැවත ලබා දීමටත් හැකිය.

- **පිරිවැය**

  මිලදී ගැනීමට අධික මුදලක් වැය වුවද නඩත්තු කිරීමට වැඩි මුදලක් වැය නොවේ.

- **බුද්ධිමය බව**

  මිනිසා විසින් නිර්මාණය කර ඇත.

  තරමක බුද්ධිමත් බවක් පෙන්වයි.

  තනිව තීරණ ගත නොහැක.

  මිනිසා තරම් බුද්ධිමත් නොවේ.

## 1.3 නිහිත පරිගණක සහිත උපාංග යනු,

පරිගණක වැඩසටහන් මගින් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන උපකරණ වේ.

උදා:- සුහුරු ජංගම දුරකථන

රෙදි සෝදන යන්ත්‍ර

නූතන මෝටර් රථ

නූතන රූපවාහිනි